**අලි පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර හා ඒවා තැම්පත් කර ඇති ස්ථාන පිළිබඳ අධ්‍යනයක්**
**(ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල පුස්තකාල ඇසුරින් සිදුකරන ලද අධ්‍යනයකි)**

**ආර්.පී. සකුන්තලා සෙනෙවිරත්න**

හස්තියා හෙවත් අලියා අනෙකුත් සත්ත්ව විශේෂයන් අතර සුවිශේෂී වන්නේ ප්‍රමාණාත්මක භාවය පමණක් පදනම් කරගෙන නොව ඓතිහාසික වශයෙන් හා මානව සමාජය තුළ විවිධ විපර්යාසයන්ට භාජනය වූ සත්ත්වයෙක් ද වශයෙනි. වඳ වී යන සත්ත්ව කොට්ඨාසයට එක් වී සිටින හස්තියා පිළිබඳ ඓතිහාසික, සමාජීය, ආගමික, කලාව හා සාහිත්‍ය තුළ මෙන්ම සත්ත්ව විද්‍යාව තුළද සුවිශේෂී වේ.

අලියා හෙවත් හස්තියා පිළිබඳ හැදෑරීමට, අධ්‍යනයේ යෙදීමට මෙන්ම තොරතුරු සොයන පර්යේෂකයන්, විශේෂඥයන් සඳහා ඒ පිළිබඳව ලියැවී ඇති පොත්පත් හා අනෙකුත් ලේඛන පිළිබඳවත්, මෙරට එම මූලාශ්‍ර තැම්පත් කර ඇති ස්ථාන පිළිබඳවත් දැනුවත් කිරීම හා අවබෝධයක් ලබා දීම මෙම අධ්‍යනයෙන් සිදු කෙරේ.

අලියා හා සම්බන්ධ විවිධ විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ ලියවී ඇති මූලාශ්‍ර ඉතාම අල්ප ප්‍රමාණයක් මෙරට දැකිය හැකි අතර එයද වැඩි වශයෙන් පවතින්නේ විශ්වවිද්‍යාල පුස්තකාල වල බව මෙම අධ්‍යනයෙන් පැහැදිලි විය. එයිනිදු සිංහල භාෂාවෙන් රචිත මූලාශ්‍ර හමුවූයේ ප්‍රමාණාත්මක වශයෙන් ගත් විට 25කටත් අවම ප්‍රමාණයකි. සමස්ත ප්‍රමානය 300 පමණ වන බවද පැහැදිලි විය. තොරතුරු මූලාශ්‍ර අතර වැඩි ප්‍රමාණයක් වූයේ පොත්පත්ය. උපාධි නිබන්ධන, ව්‍යාපෘති වාර්තා හා සඟරා මෙන්ම අප්‍රකාශිත පිටපත් හා සංගෘහිත තැටි සීමිතප්‍රමාණයක් ද තිබෙන බව පැහැදිලි විය.

මෙම මූලාශ්‍ර තුළින් හස්තියා සම්බන්ධව ලියන ලද ඔවුනගේ චර්යා රටාවන්, ඓතිහාසික හා විද්‍යාත්මක පැතිකඩ, විවිධ රටවල වෙසෙන අලි පිළිබඳ තතු, ජෛව සම්පතක් ලෙස අලි විශේෂයන් හා ඔවුන් සංරක්ෂණ කිරීම, අලි මිනිස් ගැටුම් යනාදි මාතෘකා ඔස්සේ මෙන්ම අලි පිළිබඳ ගීත, ජනකතා ආදී සාහිත්‍ය කෘති ද තිබෙන බව පැහැදිලි විය. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල අතර රුහුණ, පේරාදෙණිය, රජරට, කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර, කැලණිය, යාපනය, මොරටුව, අග්නිදිග, විවෘත, සබරගමුව යාදී විශ්වවිද්‍යාල පුස්තකාල වල මේ ඔස්සේ ලියැවුණු මූලාශ්‍ර තැම්පත්ව ඇති බව පැහැදිලි විය. තොරතුරු මූලාශ්‍ර විශාල එකතුවක් තැම්පත්ව ඇත්තේ පේරාදෙණිය විශ්වවිද්‍යාල පුස්තකාලයේ බවද පැහැදිලි විය.

මෙම මූලාශ්‍ර සංරක්ෂණ කිරීම මෙන්ම ඒවා ඉලෙක්ට්‍රොනික මූලාශ්‍රයක් ලෙස ලබාගැනීමට සුදුසු ක්‍රමවේදයන් සකස් කිරීමත්, වඳවී යන සත්ත්ව විශේෂයක් වන අලියා පිළිබඳ තොරතුරු ගවේෂණය කරන්නන් සඳහා මේ මූලාශ්‍ර එක් ස්ථානයකින් සොයාගත හැකි පරිදි අලි පිළිබඳ තොරතුරු ලබා ගත හැකි විශේෂ පුස්තකාලයක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම සුදුසු බවද යෝජනා කළ හැකිය. එය ලංකාව තුළ පමණක් නොව ආසියාතික රටවල මෙන්ම ලොව විවිධ රටවල ගවේෂකයන්ට ද පරිහරණය කළ හැකි පරිදි ප්‍රවේශ මාර්ග සකසා දීම ද සුදුසු වේ.

ප්‍රමුඛ පද :- අලියා, තොරතුරු මූලාශ්‍ර, පුස්තකාල

*** සහකාර පුස්තකාලයාධිපති - රුහුණු විශ්ව විද්‍යාලය**